**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.9,000,000ක් ලෙස ගිණුම්ගතකර තිබුණු පුස්තකාල 02ක වටිනාකම විධිමත් තක්සේරුවක් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.6,000,000ක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) සභාව විසින් රෝහල් මාවතේ ඉදිකරන ලද රු.1,839,088ක නිම්වැඩ වටිනාකමක් සහිත කඩකාමර දෙකක් රු.4,000,000ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ රු.2,160,912ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කරමැටිතැන්න ජල යෝජනා ක්‍රමයේ ජල ටැංකිය ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.280,000ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඈ) බඩල්කුඹුර ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.300,000ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ වර්ෂය තුළදී ඉටුකරන ලද කර්මාන්ත 08ක නිම්වැඩ වටිනාකම වෙනුවට ගිවිසුම්ගත වටිනාකම ගිණුම්ගත කිරීම නිසා දේපළ පිරියත උපකරණ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම රු.240,256ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සභාව සතු ටැෆේ ට්‍රැක්ටරයක වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු.118,996ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු.39,550ක් ගිණුම්ගතකර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවෙන් ලැබිය යුතු රු.40,000ක සභා ලේකම් දීමනාව ගිණුම්ගතකර නොතිබුණි.

(ඒ) සතිපොල කඩකාමර සඳහා 2014 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.132,635ක් ඉකුත් වර්ෂයේදී ලැබිය යුතු ගිණුම්වලින් ඉවත්කර සමුච්චිත අරමුදලට ගැලපීම්කර තිබුණි. මේ නිසා ලැබිය යුතු ශේෂය සහ සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

## 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### (අ) ලැබිය යුතු ගිණුම්

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දේපළ බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.379,155ක හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### (ආ) ගෙවිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක සිට ගිණුම්වල පැවත එන රු.98,420ක ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතුකර නොතිබුණි.

## 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.300,771,824ක් වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140 වගන්තිය | - | නව වරිපනම් තක්සේරුවක් සිදු නොකර 2006 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද වරිපනම් බදු රැස්කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 204 | - | 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් භාණ්ඩ අයිතම් 52ක ඌණතාවය සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 ඡේදය | 33,333 | සේවක ණය ශේෂය සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.381,662ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,653,093ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | <u>ආදායම් ප්‍රභවය</u> | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 785,000 | 912,508 | 867,200 | 455,308 | 573,400 | 777,678 | 735,521 | 42,157 |
| (ii) | කුලී | 2,907,000 | 4,125,784 | 3,530,771 | 595,013 | 3,530,000 | 3,578,474 | 3,554,691 | 23,783 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 648,700 | 660,070 | 660,070 | - | 460,200 | 657,718 | 657,718 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,504,000 | 3,234,886 | 1,994,591 | 1,240,295 | 3,208,000 | 4,928,161 | 3,737,891 | 1,190,270 |
| | **එකතුව** | **7,844,700** | **8,933,248** | **7,052,632** | **2,290,616** | **7,771,600** | **9,942,031** | **8,685,821** | **1,256,210** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට බිල්කරන ලද ආදායම රුපියල් මිලියන 8.9ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රුපියල් මිලියන 7ක් රැස්කර තිබුණි. කෙසේ නමුත් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 2.2ක හිඟයක් පැවතුණි.

### 2.2.3 වරිපනම් හා බදු

(අ) ඉකුත් වර්ෂයන්ට අදාල හිඟ වරිපනම් බදු රු.513,310ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට එම හිඟ බදුවලින් රු.312,450ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව හිඟ බදු අයකර ගැනීම් සියයට 60ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(ආ) රාජ්‍ය ආයතන 03කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.87,624ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව අයකරගතයුතු රු.48,985ක හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් අයකරගෙන නොතිබුණි.

### 2.2.4 කුලී

වාර්ෂිකව බදුදී තිබුණු දේපළ 06කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.568,117ක හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට ප්‍රසිද්ධකර තිබුණු නමුත් රු. 39,550ක ගාස්තු අයකර නොතිබුණි.

### 2.2.6 වෙනත් ආදායම්

සභාව විසින් මාර්ගතලන යන්ත්‍රය කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු රු.153,660ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.134,404ක් හා මුද්දර ගාස්තු රු. 1,233,714ක් විය.

## 03. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

### 3.1 **<u>කාර්යසාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

**(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 23ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

**(ඇ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 22 දින වනවිටත් සකස්කර නොතිබුණි.

### 3.2 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) බඩල්කුඹුර බස්නැවතුම්පල කඩකාමර 13කින් නව තක්සේරු කුලී අයනොකිරීම නිසා පෙර වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාලව රු.196,800ක කුලී ආදායම් අහිමිවී තිබුණි.

(ආ) බෝගහපැලැස්ස අංක 01 කඩකාමරයෙන් මාසික කුලිය රු.3,850ක් අය නොකිරීම නිසා ප්‍රාදේශීය සභාවට රු.38,173ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඇ) වාර්ෂිකව ටෙන්ඩර් කළයුතු බදු දේපළ 02ක් කළමනාකරණ කමිටු තීරණ මගින් බදුදී තිබුණි.

(ඇ) වැඩ නිමකර 2016 නොවැම්බර් 01 දින සභාවට භාරදී තිබුණු නව සාප්පු සංකීර්ණයේ කඩකාමර 10ක් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් බදුදීමට කටයුතුකර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සභාව විසින් අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 35ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/1/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/1/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සහා බලප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් 42ක් සම්බන්ධයෙන් අදාල ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබාදීමට හෝ නීතිමය කටයුතු සිදු කිරීමට කටයුතුකර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

(අ) ප්‍රාදේශීය සභාව සතු දේපළ 05ක් බදුදීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතීමට ඉඩහැර තිබුණි.

(ආ) සභාව සතු වාහන 03ක් වෙන්දේසි කිරීම සඳහා 2013 දෙසැම්බර් 03 දින කහගොල්ල පළාත් යාන්ත්‍රික කාර්යාලයට භාරදී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

ඉදිකිරීම් කර්මාන්තවලට අදාලව සභාව විසින් කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම් විධිමත් ආකෘතියට අනුකූල නොවූ අතර ප්‍රමාද ගාස්තු අයකිරීම පිළිබඳ කොන්දේසි ගිවිසුම්වලට ඇතුලත්කර නොතිබුණි.

## 04. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ලේඛනගත නොකිරීම |
| | | (ii) | විධිමත් පරිදි තක්සේරු නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අයනොකිරීම |
| | | (ii) | තක්සේරු කඩකුලී අයනොකිරීම |
| | | (iii) | බලපත්‍ර ගාස්තු අයනොකිරීම |
| | | (iv) | බදුදිය හැකි දේපළ බදුනොදීම |